# The Symbol of Jātaka Stories in Indian Buddhist Art

**by**

**Professor Upul Ranjith Hewawitanagamage**

**Head, Dept. of Hindi Studies, University of Kelaniya, Sri Lanka**

**Abstract**

Jātaka Stories have been played a significant role for a long period of time in the field of Buddhist art of India. When these narratives came to the hands of Indian artists, then one of the excellent art traditions prevailed in various forms in the field of Indian art. Oral tradition of the Jātaka narratives converted into new art tradition i.e. carvings and paintings in which Monoscenic, Synoptic, Conflated, Sequential, Continuous and Network narratives can be seen. This article deals with the fact that how Indian artists have converted the tradition of narrative telling and listening into a tradition of carvings and paintings, a form of reading and viewing, after which religious communication has reached a new era.

# භාරතීය බෞද්ධ කලාවේ ජාතක කථා ලකුණ

මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ, අංශ ප්‍රධාන, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

මානවයා **භාෂාව** නමැති අපූරු මෙවලම නිපදවා ගත් පසුව ඔහු මුලින් ම කළේ ඔහු තම පරිසරයේ දුටු දෑ, තමන් අත්විඳි අත්දැකීම් යනාදිය තවත් කිසිවෙකුට පැවසීම වන්නට පුළුවන. කථාන්තර ආරම්භ වන්නට ඇත්තේ මෙතැන් පටන්ය. මිහිතලය මත ජීවත්වන සෑම ජන සමාජයක ම පාහේ මේ කථාන්තර සම්ප්‍රදාය පැවැත එන අයුරු පැහැදිලි වශයෙන් ම දක්නට ලැබෙන්නකි. **ජනකථා** යන පොදු නාමයකින් හැඳින්වෙන මේ කථාන්තර සම්ප්‍රදාය ඉන්දියානු ආගමික ඉතිහාසය හා සම්බන්ධ පරිසරයෙහි ලා විශේෂ වැදගත්කමක් උසුලයි. වසර 400කට අධික කාලයක් පුරා ඉන්දියානු ආගමික සම්ප්‍රදායන් විසින් තම ඉගැන්වීම් ප්‍රචලිත කිරීමේලා කථාන්තර, ගාථා හෝ කවි යන මාධ්‍යයන් භාවිත කරන ලදි. ලෝකයේ අන්‍ය ආගමික සම්ප්‍රදායන් විසින් ද භාවිත කොට ඇත්තේ මේ ක්‍රමවේදය ම බව පවතින සාක්ෂිවලින් පෙනී යයි. මේ ක්‍රියාදාමයට අදාළ වත්මනෙහි ද දැකිය හැකි පැහැදිලි නිදර්ශනයක් වන්නේ ආදිවාසී ජනසමාජ තම සංස්කෘතික සම්ප්‍රදායයන් පිළිබඳ දැනුම කථාන්තර මාධ්‍යයෙන් නව පරපුර වෙත බෙදා හැරීමයි.

ඉන්දියානු ආගමික සම්ප්‍රදායන් තුළ වෛදික සම්ප්‍රදාය ඇතිවීමට පෙර සිට ම **ශ්‍රමණ සම්ප්‍රදාය** හෙවත් **ශ්‍රමණ සංස්කෘතිය** පිළිබඳ තොරතුරු දක්නට ලැබෙන්නේය. ඊ. ජේ. තෝමස් අදහස් කරන ආකාරයට කිසිදු විශේෂ ආගමික ඉගැන්වීමකට සම්බන්ධ නොවූ ශ්‍රමණ සම්ප්‍රදායන් භාරතීය සමාජයේ ආරම්භක අවස්ථාවේ සිට ම පාහේ ඇති වී තිබේ. ශ්‍රමණ සංස්කෘතියට අයත් කැපී පෙනෙන සම්ප්‍රදායන් දෙකක් ලෙස සලකනු ලබන්නේ බෞද්ධ හා ජෛන සම්ප්‍රදායන්ය. මෙම සම්ප්‍රදායන් දෙකෙහි ම කථාන්තර මගින් ධර්මය හා සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීම කැපී පෙනෙයි.

බෞද්ධ සම්ප්‍රදායට අනුව ජාතක කථා මගින් මූලිකව ම නිරූපණය කෙරෙන්නේ බුදුන් වහන්සේගේ පූර්ව ජන්මයන් පිළිබඳ තොරතුරුය. ජාතක කථාවලට මුල් බුදුසමයේ දී ද අතිශය වැදගත් තැනක් ලැබී ඇති බව පැහැදිලි වන්නේ ථෙරවාද සම්ප්‍රදායෙහි **නවංග සත්ථුසාසන** (සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, **ජාතක**, අබ්භූතධම්ම, වේදල්ල) නමින් **සකල බුද්ධ වචනය** වර්ග කිරීමේ දී ද 7වැනි ස්ථානයෙහි **ජාතක** යන්න ද ඇතුළත් වී තිබීම නිසාය. මහායාන සම්ප්‍රදායෙහි මේ වර්ග කිරීම සිදු කෙරෙන්නේ **ද්වාදශාංග** (සූත්‍ර, ගේය, ව්‍යාකරණ, ගාථා, උදාන, නිදාන, ඉතිවුත්තක, **ජාතක**, වෛපුල්‍ය, අබ්භූතධම්ම, අවදාන, උපදේශ) නමින් වන අතර, එහි දී 8වැනි ස්ථානය ජාතකවලට හිමි වී ඇත. මෙහි දී අපගේ අවධානයට යොමු කෙරෙන කාරණය වන්නේ වර්ගීකරණ දෙකෙහි ම පිළිවෙළින් 7 සහ 8 යන ස්ථානයන්හි **ජාතක** යන්න පිහිටුවා තිබීමයි. එයින් පෙනී යන්නේ සම්ප්‍රදායන් දෙකෙහි ම **ජාතක** යන්නට සමාන තත්ත්වයක් දී ඇති බවය. පසුකාලීනව ද සූත්‍රපිටකයෙහි දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර නිකායන් සතරට අමතර ව එන ඛුද්දක නිකායෙහි **ජාතක** (දසවන ග්‍රන්ථය) ඇතුළත් වෙයි. සමහර විද්වතුන්ගේ අදහසට අනුව මෙම **ඛුද්දක නිකාය** හෙවත් පස්වැනි නිකාය **ජාතක නිකාය** යන නමින් හැඳින්වී තිබේ.

බුදුන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේ සිට ම පැවැත එතැයි සැලකෙන ජාතක කථා සම්ප්‍රදාය වර්තමානයේ ද විවිධ බෞද්ධ සම්ප්‍රදායන්හි විවිධ ආකාරයෙන් සජීවී කථා සම්ප්‍රදායක් ලෙස භාවිත වනු දක්නට ලැබෙයි. ථෙරවාද සම්ප්‍රදායේ ජාතක 548කින් යුත් **ජාතකට්ඨකථා**, මහායාන සම්ප්‍රදායේ එන ආර්යශූර විසින් සම්පාදිත ජාතක 34කින් යුත් **ජාතකමාලා**, ගිනිකොණදිග ආසියාවේ තායිලන්තය, කාම්බෝජය, මියන්මාරය වැනි බෞද්ධ රටවල ජාතක 50කින් යුත් **පඤ්ඤාස ජාතක**, ජාතක 540කින් සහ තවත් අමතර ජාතක 8කින් සමන්විත වුවත් **පන්සියපණස් ජාතක පොත් වහන්සේ** යනුවෙන් හැඳින්වෙන **සිංහල ජාතක පොත**, ජපානයේ කතා 32කින් යුත් **කොන්ජකු මොනොගතරි** ජාතක පොත ආදි වශයෙන් මෙන් ම චීන, ලාම්ඨියන් වැනි භාෂාවලින් සංග්‍රහ කොට ඇති ජාතක පොත් ද සලකා බලන විට ජාතක සාහිත්‍යයෙහි ඇති වැදගත්කම ඉස්මතු වී පෙනෙයි.

බෞද්ධ කලාකරුවන් අතට පත් ජාතක කථාව විශිෂ්ට කලා නිර්මාණ බිහි කරමින් විශිෂ්ට කලා සම්ප්‍රදායන් බිහි කිරීමට දායක වූයේ මුඛ පරම්පරාගතව ගෙනා කථාන්තර සම්ප්‍රදායට නව මුහුණුවරක් ලබා දෙමිනි. බුදුදහම ඇරඹුණු භාරතයේ සිට බුදුදහමෙහි බලපෑම ලැබූ සෑම පෙරදිග රටක ම ජාතක හා බැඳුණු කථා සම්ප්‍රදායන් පමණක් නොව කලා සම්ප්‍රදායන් ද බිහි වී ඇති බව පැහැදිලිව පෙනී යන කරුණකි.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 218කට පසු නැතහොත් ක්‍රි. පූ. 264 දී රාජ්‍යත්වයට පත් වන අශෝක අධිරාජයාගේ කාලයේ සිට ජාතක හා සම්බන්ධ තොරතුරු පුරාවිද්‍යාත්මක සාධක වශයෙන් දක්නට ලැබෙන බව පිළිගැනෙයි. අශෝක අධිරාජයා විසින් ස්ථාපිත ශිලා ස්ථම්භ අතරින් 3වැන්නෙහි සඳහන් වන '**මිනිසුන්ගේ හොඳ-නරක ක්‍රියා**' පිළිබඳ අදහස්, බුදුදහමේ කේන්ද්‍රීය සිද්ධාන්තයක් වන කර්මය හා ඵලය සම්බන්ධ අදහස්වලට නැතහොත් ඍජුව ම ජාතක කථාවලට සම්බන්ධතාවක් දක්වන බව පෙනී යයි.


ක්‍රි. පූ. දෙවැනි හෝ පළමුවැනි සියවසෙහි ස්ථාපනය කරන ලදැයි සැලකෙන භාර්හුත් ස්තූපයෙන් ලැබුණු පුරාවිද්‍යාත්මක සාක්ෂි ජාතක හා සම්බන්ධ පැරණි ම තොරතුරු ලෙස සැලකෙයි. මෙම ස්ථානය සාංචියට සැතපුම් 200ක් පමණ වයඹ දිගින් පිහිටි මධ්‍යම භාරතයෙහි පිහිටා ඇත. එහි උන්නත කැටයම් ලෙසින් ඉදිරිපත් වන '**කේවල දර්ශන වෘත්තාන්ත**'වල (Monoscenic Narrative) දක්නට ලැබෙන්නේ අදාළ කථාවේ තේමාව හෙවත් මූලික හරයයි (අංක 01). සමහර ජාතක කථාවක් **සංක්ෂිප්ත වෘත්තාන්තයක්** (Synoptic Narrative) ලෙසින් විශාල පදක්කමක ආකාරයෙන් ඉදිරිපත් වෙයි (අංක 02). කථාවක කොටස් කිහිපයක් හෝ දර්ශන කිහිපයක් ඉදිරිපත් කෙරෙන '**සංකලිත වෘත්තාන්ත**' (Conflated Narrative) සංක්ෂිප්ත වෘත්තාන්තවල ම විකාසනයක් යැයි සැලකේ (අංක 03). සමහර ජාතක කථාවක් නිරූපණය කෙරෙන කැටයමක එහි මාතෘකාව ලෙසින් අදාළ පාලි ගාථාවේ ආරම්භක වචනය සඳහන් කොට ඇත (අංක 04). විද්‍යා දේහ්ජියා සඳහන් කරන ආකාරයට ගාථාවේ මුල් වචනය සටහන් කොට තැබීමෙන් පෙනී යන්නේ, මේ වන විටත් පාලි ත්‍රිපිටකය මුඛ පරම්පරාගතව තිබීමත්, ඉතා ඉහළ සාක්ෂරතා අගයක් මේ යුගයේ නොතිබීමත් යන කාරණා කෙසේ වුව ද මෙහි පැමිණි ජනයාට මේ සම්බන්ධයෙන් මනා පරිචයක් තිබූ බවයි.



අංක 01 වෙස්සන්තර ජාතකය (547)
**කේවල දර්ශන වෘත්තාන්තයක්** (Monoscenic Narrative) ලෙසින්.
භාර්හුත් ස්තූපය



අංක 02 මහා කපි ජාතකය (407)
**සංක්ෂිප්ත වෘත්තාන්තයක්** (Synoptic Narrative) ලෙසින්.
භාර්හුත් ස්තූපය



අංක 03 ලටුකික ජාතකය (357) **සංක්ෂිප්ත වෘත්තාන්තයක්** (Conflated Narrative) ලෙසින්.
භාර්හුත් ස්තූපය




අංක 04 සුවණ්ණකක්කට ජාතකය (389)
**කේවල දර්ශන වෘත්තාන්තයක්** (Monoscenic Narrative) ලෙසින්. මෙහි රූපයට ඉහළින් කථාවේ නම සඳහන් කොට ඇත.
භාර්හුත් ස්තූපය

මේ යුගයට ම අයත් යැයි සැලකෙන සාංචි ස්තූප පරිශ්‍රයෙහි ද ජාතක හා සම්බන්ධ මෙවැනි කලා නිර්මාණ දක්නට ලැබෙයි. පළමුවැනි සාංචි ස්තූපයෙහි දකුණු තොරණෙහි **ඡද්දන්ත ජාතකය** (514) **අවිච්ඡින්න වෘත්තාන්තයක්** (Continuous Narrative) ලෙසින් ඉදිරිපත් වී ඇති අතර (අංක 05), එහි ම උතුරු තොරණෙහි එම කථාව ම **කේවල දර්ශන වෘත්තාන්තයක්** ලෙස ද ඉදිරිපත් වෙයි. **වෙස්සන්තර ජාතකය** (547) ද පළමුවැනි සාංචි ස්තූපයෙහි නැගෙනහිර තොරණෙහි **අවිච්ඡින්න වෘත්තාන්තයක්** (Continuous Narrative) ලෙසින් දක්වා ඇත (අංක 06).




අංක 05 ඡද්දන්ත ජාතකය (514) **අවිච්ඡින්න වෘත්තාන්තයක්** (Continuous Narrative) ලෙසින්. සාංචි ස්තූපය 1, දකුණු තොරණ



අංක 06 වෙස්සන්තර ජාතකය (547) **අවිච්ඡින්න වෘත්තාන්තයක්** (Continuous Narrative) ලෙසින්. සාංචි ස්තූපය 1, නැගෙනහිර තොරණ

දක්ෂිණ භාරතයේ **ගෝලි** නමැති ස්ථානයෙන් හමු වූ උන්නත කැටයමක වෙස්සන්තර ජාතකය දැක්වෙන්නේ **මාලා වෘත්තාන්තයක්** (Sequential Narrative) ලෙසය. මෙය **අවිච්ඡින්න වෘත්තාන්තයකට** (Continuous Narrative) සමාන වුව ද, එයින් වෙනස් වන්නේ නිතර ම විවිධ කාලයන්හි හා ස්ථානවල දී කථා නායකයාගේ ප්‍රවේශය සනිටුහන් කිරීම මෙහි දී ප්‍රධාන අරමුණ වී ඇති බැවිනි. මෙහි දී කථාව විකාසනය වන්නේ වමේ සිට දකුණට වන අතර, දර්ශන වෙන් කිරීම සිදු කොට ඇත්තේ මනා ලෙස නිම වූ කුළුණු, වෘක්ෂ වෙනත් සිරස් දැ යොදා ගනිමිනි (අංක 07). **චම්මසාටක ජාතකය** (324) ද **මාලා වෘත්තාන්තයක්** ලෙස භාර්හුත් ස්තූපයෙහි නිරූපණය කොට ඇත (අංක 08).




අංක 07 වෙස්සන්තර ජාතකය (547) **මාලා වෘත්තාන්තයක්** (Sequential Narrative) ලෙසින්. ගෝලි, දක්ෂිණ භාරතය



අංක 08 චම්මසාටක ජාතකය (324) මාලා **වෘත්තාන්තයක්** (Sequential Narrative) ලෙසින්. භාර්හුත් ස්තූපය


දක්ෂිණ භාරතයෙහි ගිනිකොණදිග ආන්ද්‍ර කලාපයේ ක්‍රිෂ්ණ ගංගා නිම්නයට අයත් ප්‍රදේශය බෞද්ධ කේන්ද්‍රයක් බවට පත් වී තිබුණු අතර, අමරාවතී (ක්‍රි. ව. 1 සහ 2) සහ නාගර්ජුනකොණ්ඩ (ක්‍රි. ව. 3 සහ 4) යන ස්ථානවල ද ජාතක කථා හා සම්බන්ධ බෞද්ධ කලා නිර්මාණ දැක ගත හැකිය. මෙහි දී **මාලා වෘත්තාන්ත** (Sequential Narrative), **අවිච්ඡින්න වෘත්තාන්ත** (Continuous Narrative), **සංක්ෂිප්ත වෘත්තාන්ත** (Synoptic Narrative) ආදි ක්‍රමවේද මෙන් ම **වෘත්තාන්ත ජාල** (Narrative Network) යන ක්‍රමවේදය ද ජාතක කථා ඉදිරිපත් කිරීමේ ලා භාවිත වී ඇත (අංක 09, 10, 11).




අංක 09 විදුර පණ්ඩිත ජාතකය (545) **වෘත්තාන්ත ජාල** (Narrative Network) ලෙසින්. අමරාවතී



අංක 10 ඡද්දන්ත ජාතකය (514) **සංක්ෂිප්ත වෘත්තාන්තයක්** (Synoptic Narrative) ලෙසින්. අමරාවතී




අංක 11 මහාපදුම ජාතකය (472) **මාලා වෘත්තාන්තයක්** (Sequential Narrative) ලෙසින්. නාගර්ජුනකොණ්ඩ

පුරාණ ඉන්දියාවේ සොළොස් මහා ජනපද අතරින් වයඹදිග ඉන්දියාවේ පිහිටි එක් ජනපදයක් වූ ගාන්ධාරය විශිෂ්ට බෞද්ධ කලා සම්ප්‍රදායකට නෑකම් කියයි. ධර්මාශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාර ව්‍යාපාරයෙහි ප්‍රතිඵලයක් ලෙස බුදුදහම මේ ප්‍රදේශයට ලැබුණු බව කියැවෙන අතර, අශෝක, යුවරජු ලෙස කටයුතු කළ සමයේ දී මේ ප්‍රදේශයේ ආණ්ඩුකාරයා වශයෙන් සිටි බව ද සඳහන් වෙයි. ගාන්ධාර කලා සම්ප්‍රදායෙහි බුදුන් වහන්සේගේ ජීවන තොරතුරු හා සම්බන්ධ සිද්ධීන් නිරූපණය කෙරෙන අතර, හීනයාන සහ මහායාන යන උභය සම්ප්‍රදායන්හි ජාතක කථා ද නිරූපණය කෙරෙයි. ගාන්ධාර කලාකරුවා බොහෝ විට **ස්ථිතික කේවල දර්ශන මාධ්‍යය** (Static Monoscenic Mode) සිය කලා නිර්මාණ සඳහා භාවිත කළ ද, ජාතක කථා සඳහා ඔහු නිරතුරුව භාවිත කළේ **අවිච්ඡින්න වෘත්තාන්ත** ක්‍රමවේදයයි. ගාන්ධාරයෙහි අතිශය ජනප්‍රිය වූ ජාතක කථා අතුරින් **වෙස්සන්තර ජාතකය** (අංක 12) සහ **සාම ජාතකය** (අංක 13) ප්‍රමුඛ වන අතර, **ඡද්දන්ත ජාතකය, මිග ජාතකය, මහා උම්මග්ග ජාතකයේ** එන අමරාදේවී කථාව ආදිය ද දක්නට ලැබෙයි. ජාතකමාලාවේ එන **ක්ෂාන්තිවාදී ජාතකය, මෛත්‍රීබල ජාතකය, ව්‍යාඝ්‍රී ජාතකය, සිබි ජාතකය** ආදිය මෙන් ම, අවදාන සම්ප්‍රදායේ එන **චන්ද්‍රප්‍රභා අවදානය, අශෝකාවදානය** ආදිය ද ගාන්ධාර කලාවේ නිරූපණය කොට ඇත.




අංක 12 සාම ජාතකය (545) **අවිච්ඡින්න වෘත්තාන්තයක්** (Continuous Narrative) ලෙසින්. ජාමල්ගඩී, ගාන්ධාරය




අංක 13 වෙස්සන්තර ජාතකය (547) **අවිච්ඡින්න වෘත්තාන්තයක්** (Continuous Narrative) ලෙසින්. ජාමල්ගඩී, ගාන්ධාරය


ක්‍රි. පූ. 1වැනි සියවසෙහි දී පමණ ස්ථාපනය කරන ලදැයි සැලකෙන අජන්තා ලෙන් විහාර පිහිටා ඇත්තේ භාරතයේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ ඖරංගාබාද් දිස්ත්‍රික්කයෙහිය. මෙම ලෙන් විහාර ක්‍රි. පූ. 2 සිට ක්‍රි. ව. 6 දක්වා කාලය තුළ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වස්සාන සමය ගත කිරීමට භාවිත කළා යැයි සැලකේ. භාරතීය බෞද්ධ කලාවේ ජාතක කථා හා සම්බන්ධ විශිෂ්ටතම නිර්මාණ රාශියක් බිතු සිතුවම් ලෙසින් අජන්තා ලෙන් විහාරවල දක්නට ලැබෙයි.

මෙහි ගුහා විශාල සංඛ්‍යාවක් තිබුණ ද එයින් 1, 2, 16, 17 යනුවෙන් නම් කොට ඇති ගුහා ප්‍රධාන ලෙන් විහාර ලෙස සැලකෙයි. මේ විහාරවල ඇති සිතුවම් මූලික වශයෙන් ම කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්, '**බුදුන් වහන්සේගේ ජීවිතයේ විශේෂ අවස්ථා හා සම්බන්ධ සිතුවම්**' සහ '**බුදුන් වහන්සේගේ පෙර ආත්ම භවයන් හා සම්බන්ධ සිතුවම්**' යනුවෙනි.

අජන්තා සිතුවම්වලට පදනම් කොට ගත් සාහිත්‍ය මූලාශ්‍ර අතර ප්‍රධාන ස්ථානයෙහි ලා සැලකෙන්නේ සංස්කෘත මූලාශ්‍රයන්ය. ක්‍රි. ව. 4 සියවසේ දී ලියැවුණා යැයි සැලකෙන ආර්යශූරගේ **ජාතකමාලා** නම් ග්‍රන්ථයෙහි නිරූපිත කථා සියල්ල ම පාහේ මෙහි චිත්‍රණය වී ඇත්තේය. ලෙන් අංක 17හි එන සිතුවම් 17ක් අතරින් 13කට ම පදනම් වී ඇත්තේ **ජාතකමාලා**වය. මෙයට අමතරව මූලසර්වාස්තිවාදී විනය, දිව්‍යාවදානය, ලලිත විස්තරය, අශ්වඝෝෂයන්ගේ සෞන්දරානන්ද කාව්‍යය, පාලි ජාතකට්ඨකථාව ආදි මූලාශ්‍රයන් ද මෙම චිත්‍රවලට පාදක වී ඇත්තේය. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණක් නම් බෞද්ධ සම්ප්‍රදායේ හීනයාන සහ මහායාන යන ප්‍රධාන අනු සම්ප්‍රදායන් ද්වය ම අජන්තා කලාකරුවන්ගේ අවධානයට යොමු වූ බවයි.

විද්‍යා දේහ්ජියා සඳහන් කරන ආකාරයට අජන්තා කලාකරුවන් විසින් දෘෂ්‍ය වෘත්තාන්ත හෙවත් කථාන්තර නිරූපණය කිරීම සඳහා ක්‍රම වේද 7ක් පමණ භාවිත කරනු ලැබ ඇති බව පෙනී යයි. මෙයින් ප්‍රධාන වශයෙන් දැක්විය හැකි ක්‍රම 3කි. එනම්,

1. වෘත්තාන්ත ජාල (Narrative Network)
2. සංක්ෂිප්ත වෘත්තාන්ත (Synoptic Narrative)
3. කේවල දර්ශන වෘත්තාන්ත (Monoscenic Narrative)




අංක 14 ඡද්දන්ත ජාතකය (514) **සංක්ෂිප්ත වෘත්තාන්තයක්** (Synoptic Narrative) ලෙසින්. අජන්තා, ගුහා අංක 17




අංක 15 මච්ඡ ජාතකය (216) **කේවල දර්ශන වෘත්තාන්තයක්** (Monscenic Narrative) ලෙසින්. අජන්තා, ගුහා අංක 17


සිතුවම් සහිත ප්‍රධාන ලෙන් විහාර සතරෙන් ප්‍රධානතම ලෙන ලෙස සැලකෙන්නේ ගුහා අංක 17ය. මෙය වර්ග අඩි 70ක පමණ විශාලත්වයකින් යුක්තය. **සංක්ෂිප්ත වෘත්තාන්ත** ලෙසින් ඉදිරිපත් වන ජාතක කථාවලින් නිරූපණය වන්නේ බෝධිසත්ත්වයන් තිරිසන් සතුන් ලෙස ඉපදුණු අවස්ථාවන්ය. ගවයා, හාවා, මුවා, වානරයා, හංසයා, අලියා ආදි සත්ත්ව චරිත ඇතුළත් ජාතක කථා මෙහි ඉදිරිපත් වෙයි. එමෙන් ම සිවි රජතුමා සහ සාම කුමාරයා පිළිබඳ නිරූපණයන් ද මෙහි දක්නට ඇත. **මහාකපි ජාතකය** මෙහි දක්වා ඇත්තේ අවස්ථා අටකිනි. **වෘත්තාන්ත ජාල** (Narrative Network) වශයෙන් ඉදිරිපත් වී ඇති ජාතක කථා අතර **සිංහල වෙළෙන්දාගේ කථාව** (අවදානය) (පාලි සමාන කථාවඃ **වලාහස්ස ජාතකය**), **වෙස්සන්තර ජාතකය**, **සුතසෝම ජාතකය**, **සක්‍ර ජාතකය** ආදිය දැකිය හැකිය. ගුහා අංක 16හි ආර්යශූරයන්ගේ **ජාතකමාලාවෙහි** එන ජාතක 34ක් සිතුවමට නගා ඇත. මෙහි ද **වෘත්තාන්ත ජාල** දක්නට ලැබේ. ගුහා අංක 1හි පාලි ජාතකට්ඨකථාව පදනම් කොට ගත් සිතුවම් දක්නට ලැබෙයි. ඒවා ඉදිරිපත් කෙරෙන්නේ **සංක්ෂිප්ත වෘත්තාන්ත** ක්‍රමයටය. ගුහා අංක 2හි **වෘත්තාන්ත ජාල** වශයෙන් ඉදිරිපත් කෙරෙන ජාතක සිතුවම් දක්නට ලැබෙයි. එයින් **හංස ජාතකය**, **විදුර ජාතකය** වැනි කතා පාලි ජාතකට්ඨකථාව පදනම් කොට ගෙන ඇති බව පෙනී යයි. **සංක්ෂිප්ත වෘත්තාන්ත** ලෙස දැක්වෙන සිවි ජාතකයේ සිතුවම් ද මෙහි දක්නට තිබේ.



අංක 16 සිංහල වෙළෙන්දාගේ කථාව (අවදානය) **වෘත්තාන්ත ජාලයක්** (Narrative Network) ලෙසින්. අජන්තා, ගුහා අංක 17




අංක 17 සාම ජාතකය (540) **සංක්ෂිප්ත වෘත්තාන්තයක්** (Synoptic Narrative) ලෙසින්. අජන්තා, ගුහා අංක 17



අංක 18 වෙස්සන්තර ජාතකය (547) **වෘත්තාන්ත ජාලයක්** (Narrative Network) ලෙසින්. අජන්තා, ගුහා අංක 17

අජන්තා සිත්තරුන් ජාතක කථා නිරූපණය කිරීමෙහි ලා විවිධ ආකෘති භාවිත කළ බව පෙනී යයි. ඔවුන් වඩාත් අගය කළ සාමාන්‍ය කථාන්තර ඉදිරිපත් කිරීම සඳහා **වෘත්තාන්ත ජාල** භාවිත කළ ද, **සංක්ෂිප්ත වෘත්තාන්ත** ආකෘතිය අතිශය ජනප්‍රිය වූ බව පෙනී යයි. මේ ආකෘති දෙකට ම අයත් **කතා නැරඹීම/කියවීම** සඳහා නරඹන්නාගේ/කියවන්නාගේ ඍජු සහභාගිත්වය අවශ්‍ය වෙයි. ලෙන් විහාරවල ඇති අතිශය සීමිත ඉඩ ප්‍රමාණය නිසා ම සිත්තරුන් කථාන්තරවල එන **කාලය** නිරූපණය කිරීම හිතාමතා ම නොසලකා හැර ඇති බව පෙනී යන්නේ අංක 17 ලෙනෙහි එන **සිංහල වෙළෙන්දාගේ කථාව, වෙස්සන්තර ජාතකය, සුතසෝම ජාතකය** ආදි ජාතක කථා නිරූපණය කර ඇති ආකාරයෙනි. උදාහරණයක් ලෙස **සුතසෝම ජාතකය** නිරූපණය කෙරෙන සිතුවමෙහි වම්පසින් හස්තිනාපුරය දැක්වෙන අතර, දකුණුපසින් වාරාණසී නගරය දැක්වෙයි. මැද කොටස වෙන් කොට ඇත්තේ වනාන්තරය නිරූපණය කිරීම සඳහාය.

අද්‍යතනයේ ද විද්‍යමාන ලොව අති පැරණි බිතුසිතුවම් කලා සම්ප්‍රදායට අයත් ප්‍රත්‍යක්ෂ උදාහරණයක් ලෙස පවතින අජන්තා ලෙන් චිත්‍රවල ජාතක කථාවන්ට විශේෂ ස්ථානයක් හිමි වී තිබීමෙන් තත්කාලීන ජන සමාජයෙහි ජාතක කථාව හිමි කරගෙන තිබුණු කීර්තිය කොතරම් ද යන්න පැහැදිලි වන්නේය. මෙහිදී පෙනී යන තවත් වැදගත් කරුණක් වන්නේ ධර්ම සන්නිවේදනයෙහි ලා **කථාන්තර කීමේ හා ඇසීමේ සම්ප්‍රදාය** කැටයම් හා සිතුවම් මාධ්‍යය මගින් **කථාන්තර කියවීමේ** හෙවත් **කථාන්තර නැරඹීමේ සම්ප්‍රදායක්** කරා ගෙන යෑමට බෞද්ධ කලාකරුවා උත්සුක වී ඇති ආකාරයයි.❐

**ආශ්‍රිත ග්‍රන්ථ:**


Akira, Hirakawa (1990) **A History of Indian Buddhism,** USA, University of Hawaii Press.
Bapat, P. V. 'Principal Schools and Sects of Buddhism' *In* **2500 Years of Buddhism** (1977) Bapat, P. V. (Edi.), Govt. of India, Publication Division.
Barua, Dipak (1971) **An Analytical Study of Four Nikāyas,** Culcutta, Rabindra Bharati University.
Dehejia, Vidya (1997) **Discourse in Early Buddhist Art**, Delhi, Munshiram Mannoharlal.
Handurukanda, Ratna 'Jātakamālās in Sanskrit' *In* **The Sri Lanka Journal of the Humanities Vol. XI** (1985) Sri Lanka, University of Peradeniya.
Khanna, Anita (1999) **The Jataka Stories in Japan,** Delhi, B. R. Publishing Corporation.
Speyer, J. S. (Tr.) (1971) **The Jātakamālā,** Delhi, Motilal Banarasidas Publishers Pvt. Ltd..
Thomas, E. J. (1953) **The History of Buddhist Thought**, London, Routlrdge & Keagan Paul Ltd..
Winternitz, M. (1977) **History of Indian Literature** Vol. II**,** New Delhi, Oriental Books Reprint Corporation.


---


**Professor Upul Ranjith Hewawitanagamage, Professor, Head, Dept. of Hindi Studies, University of Kelaniya, Kelaniya.**
B. A. (Hons), M. Phil. in Hindi Studies (Kelaniya), Ph. D. in Hindi Studies (JNU, New Delhi)
PG Dip in Writership and Communication (Sri Jayawardhanepura)
Vaadya Vishaarad (Lucknow), Bengali Cert. (JNU, New Delhi)